L

Article 12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2018/07/03

පැමිණිලිකරු : එච්.පී.ජී චන්ද්‍රසිරි මයා.
අංක 372/01. බිසෝ උයන.
දියසෙන්පුර.

වගඋත්තරකරුවන් :

01. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය.
අනුරාධපුරය.

02. ලේකම්.
සෞඛ්‍ය අමාත්‍යංශය.
උතුරු මැද පළාත් සභා සංකීර්ණය.
අනුරාධපුරය.

03. ප්‍රධාන ලේකම්.
ප්‍රධාන ලේකම් කාර්යාලය.
උතුරු මැද පළාත.
අනුරාධපුර.

04. ලේකම්.
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය.
අනුරාධපුරය.

පැමිණිලි අංකය : **HRC/AP/236/2014**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ. 2011.10.09 දින රාජකාරී සඳහා නිවසේ සිට ආයතනයට පැමිණෙමින් සිටියදී මාර්ගයේදී රිය අනතුරකට ලක් වූ බවත්. මෙම අනතුර සම්බන්ධයෙන් අංක 21595/11 යටතේ ගරු අධිකරණයේ විභාග වූ නඩුවෙන් තමන් නිදොස් වූ බවත්ය. එමෙන්ම රා.ප.ච 22/93 යටතේ රාජකාරියේ යෙදී සිටියදී තුවාල ලබන රාජ්‍ය නිලධාරීන්ට වන්දි ගෙවීමේ චක්‍රලේඛනයේ සඳහන්

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580/81/82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575 / 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
වෙබ් / இணையம் / www.hrcsl.lk

ප්‍රතිපාදන අනුව වන්දි ඉල්ලීම් කළ බවත්. නමුත් අදාළ වන්දි මුදල තමන්ට ලබා දීමට වගඋත්තරකරු කටයුතු කර නොමැති බවත් දක්වා ඇත.

වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ :-

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරයා විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති 2014.05.31 දිනැති ලිපියෙන් දක්වා ඇත්තේ. පැමිණිලිකරුට සිදුවූ අනතුර සම්බන්ධයෙන් 2011.10.09 දින සිට 2011.10.24 දින දක්වා දින 16 ක කාලයකට හදිසි අනතුරු නිවාඩු අනුමත කර ඇති බවත්, ඒ අනුව පැමිණිලිකරු විසින් ඉල්ලුම් කර ඇති වන්දි මුදල් කාර්යාලය වෙත ලැබී ඇති බවත්. නමුත් පැමිණිලිකරු විසින් වන්දි ඉල්ලීම් කරන ලද ලිපිවල අඩුපාඩු පැවති අතර එම ලියකියවිලි පැමිණිලිකරු විසින් වරින් වර ඉදිරිපත් කරන ලද බවත්. ඒ හේතුවෙන් හදිසි අනතුරු නිවාඩුව පළාත් සෞඛ්‍ය ලේකම් විසින් අනුමත කරන ලද්දේ 2013.05.28 දින වන බවත්ය. ඉන් අනතුරුව පැමිණිලිකරුට වන්දි ගෙවීම සඳහා ඉපයීමේ ශක්ති ප්‍රතිශතය කීයකින් හීනවූයේදැයි තහවුරු කිරීමක් සිදුකර නොමැති බවත් මෙම හේතූන් මත මෙම පැමිණිලිකරු හට අදාළ වන්දි මුදල් ගෙවීම ප්‍රමාද වී ඇති බවත් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරයා විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති වාර්තාවේ සඳහන් කර ඇත.

එසේම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් පැමිණිලිකරුට අදාළ හදිසි අනතුරු වන්දි ලබා දීම සඳහා වූ ලේඛන 2016.05.17 දිනැති ලිපිය මඟින් අනුමැතිය සඳහා ප්‍රධාන ලේකම් වෙත යවා ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් 2016.10.24 දින කොමිසම වෙත ලිපියක් යොමු කරමින්. පැමිණිලිකරුට අදාළ හදිසි අනතුරු වන්දි ලබා දීමේ ගොනුව ආණ්ඩුකාර ලේකම් වෙත යොමු කර ඇත.

ආණ්ඩුකාර ලේකම්ගේ අංක 2017.03.10 දිනැති වාර්තාව මඟින්. පැමිණිලිකරුට අදාළ හදිසි අනතුරු වන්දි අයදුම්පත තම කාර්යාලය වෙත ලද පසු එය පළාත් වන්දි කමිටුව වෙත යොමු කිරීමට කටයුතු කරන බවට දක්වා ඇත.

ප්‍රධාන ලේකම්වරයා විසින් කොමිෂන් සභාව වෙත 2017.03.21 දිනැති වාර්තාව යොමු කරමින් දන්වා ඇත්තේ. පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු උපස්ථායක එච්.පී.ජී චන්ද්‍රසිරි මහතාගේ හිදිසි අනතුරු වන්දි අයදුම්පත්‍රය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් ප්‍රථමයෙන් තම කාර්යාලය වෙත එවා ඇත්තේ 2016.05.23 දින බවත්. අනතුරුව එහි අඩුපාඩු සම්පූර්ණ කර එවන ලෙස දන්වා ගොනුව සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත යොමුකළ බවත් ය.

අඩුපාඩු සම්පූර්ණ කර නැවත 2016.08.29 දින තම කාර්යාලය වෙත ගොනුව ලද බවත්. 2016.09.14 දින එය ආණ්ඩුකාර ලේකම් වෙත යැවූ බවත්. 2016.11.16 දින නැවත ගොනුව තම කාර්යාලය වෙත ආණ්ඩුකාර ලේකම් විසින් එවා තිබූ බවත් දක්වා ඇත.

එමෙන්ම නැවත ගොනුව සම්පූර්ණ කර 2016.11.26 දින පොළොන්නරුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත යොමුකර ඇති නමුත් මෙතෙක් ගොනුව සම්බන්ධයෙන් පිළිතුරු ලැබී නොමැති බවත්. 2017.03.10 දින සිහිකැඳවීම්ද යවා ඇති බවත් සඳහන් කර ඇත.

නිරීක්ෂණ :-

පැමිණිලිකරු මැදිරිගිරිය රෝහලේ උපස්ථායකයෙකු ලෙස සේවයේ යෙදී සිටියදී මෙන්ම 2011.10.09 දින නිවසේ සිට රාජකාරී සඳහා යමින් සිටියදී හදිසි අනතුරකට ලක්ව ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුගේ පැමිණිල්ල අනුව මෙම අනතුර සම්බන්ධයෙන් ගරු අධිකරණයේ අංක 21595/11 දරණ නඩුව විභාග වී පැමිණිලිකරුව නඩුවෙන් නිදොස් වී ඇති බවද නිරීක්ෂණය වේ. එසේම පැමිණිලිකරු අදාළ තනතුර හේතුවෙන් රෝහල් ගත වී නේවාසිකව දින 16 ක් ප්‍රතිකාර ලබාගෙන ඇති බවටත් 2011.10.24 දින දක්වා හදිසි අනතුරු නිවාඩු අනුමත වී ඇති බවටත් නික්ෂණය වේ.

පැමිණිලිකරුට සිදුවූ අනතුර සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/93 යටතේ හදිසි අනතුරු වන්දි අදාළ රාජ්‍ය නිලධාරීන් වෙතින් ඉල්ලා සිට ඇති නමුත් මේ දක්වා පැමිණිලිකරුට හිමි වන්දි මුදල ලබා දීමට වගඋත්තරකරුවන් මෙතෙක් කටයුතු කර නොමැත.

පැමිණිලිකරු විසින් 2014.04.21 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමුකරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන් වෙතින් වාර්තා කැඳවීමට කටයුතු කර ඇති අතර වගඋත්තරකරුවන් විසින් කොමිෂන් සභාව වෙත යොමුකර ඇති ඉහත සියළු වාර්තාවන්හි සඳහන් කරුණු අනුව පෙනී යන්නේ. පැමිණිලිකරු 2011.10.09 වන දින හදිසි අනතුරකට ලක්වූ නමුත් හිදිසි අනතුරු නිවාඩු සඳහා වන්දි ඉල්ලීම් ඉදිරිපත් කරන ලද ලිපිවල අඩුපාඩු හේතුවෙන් හා හදිසි අනතුරු නිවාඩු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් අනුමත කර ඇත්තේ 2013.05.28 දින වීම හේතුවෙනුත් පැමිණිලිකරු 2013.05.28 දිනෙන් පසු වන්දි ඉල්ලා සිටීම හේතුවෙනුත් පැමිණිලිකරුව වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් වෙත පමුණුවා ඉපයීමේ ශක්ති ප්‍රතිශතය කීයකින් හීන වූයේද යන්න පිළිබඳව තහවුරු කර ගැනීමක් සිදුව නොමැති නිසාවෙනුත් හදිසි අනතුරු වන්දි ලබා දීම ප්‍රමාඩ් වී ඇති බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන් විසින් කොමිසම වෙත යොමුකර ඇති ලේඛන අනුව 22/93 චක්‍රලේඛනය යටතේ පැමිණිලිකරුට හිමිවිය යුතු හදිසි අනතුරු වන්දි මුදල ලබා දීම සම්බන්ධයෙන් තවදුරටත් අදාළ ආයතන අතරේ ලිපි හුවමාරුවීමක් සිදුවන බව නිරීක්ෂණය වන අතර. මෙතෙක් පැමිණිලිකරුට වන්දි ගෙවීම සම්බන්ධ ලිපිගොනුවේ ලේඛන සම්පූර්ණ කර ගැනීමට වගඋත්තරකරුවන් කටයුතු කර නොමැති බවද නිරීක්ෂණය වේ.

ඉහත සියළු කරුණු නිරීක්ෂණය කිරීමේදී 2013 වසරේ සිට පැමිණිලිකරු විසින් ඉල්ලුම් කරන හදිසි අනතුරු වන්දි මුදල ලබා දීම පමා කරමින් වගඋත්තරකරුවන් කටයුතු කරන බව හා ලිපිගොනුවල

අඩුපාඩු පවතින බව දන්වමින් පැමිණිලිකරුට වන්දි ලබා ගැනීමට නීත්‍යානුකූලව ඇති අයිතිය සාධාරණ හේතු දැක්වීමකින් තොරව දීර්ඝ කාලයක් ගත වුවත් ලබා නොදෙමින් සිටින බව නිරීක්ෂණය වන අතර මෙමඟින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තියේ සඳහන් 'නීතිය ඉදිරියේ සර්ව සාධාරණත්වයට ඇති මූලික අයිතිය' උල්ලංඝනය වී ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

පැමිණිලිකරු විසින් ඉල්ලුම් කරනු ලබන හදිසි අනතුරු වන්දි මුදල කඩිනමින් පැමිණිලිකරු වෙත ලබා දීමට පියවර ගත යුතු බවට වගඋත්තරකරුවන් වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

2018.07.31 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. N. D. Udagama
Chairperson
B/Human Rights Commission of Sri Lanka

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.